මාපා ගුරුගෙදර

# Basic English

# මූලික ඉංග්‍රීසි

## සා/පෙළ A සඳහා වන පාඨමාලාව

**The English course every child must follow**

**සෑම දරුවෙක් ම හැදෑරිය යුතු ම ඉංග්‍රීසි පාඨමාලාව**

**ஒவ்வொரு பிள்ளையும் படிக்க வேண்டிய ஆங்கில பாடநெறி**


උපදෙස්

සිංහල

පාඨමාලාව හැදෑරීමට පෙර හොඳින් කියවන්න.

# Find where you are

A clear route
for
guaranteed
success




| Exam Question Papers | | | English for O/L's | To Grade 11 |
|---|---|---|---|---|
| Reading And Compre- -hension | gra- -mmar | Writing diary, letters and essays | | |

Scan me

| Test | Basic Eng- -lish grammar and writing | From Grade 6 |
|---|---|---|
| More Adjectives | | |
| Let's Use Adjectives | | |
| Auxiliaries | | |
| Let's Use Verbs | | |
| Basic sentences | | |
| Possession | | |
| A, an, the | | |
| Singular – Plural | | |

| My First 1000 Words Spellings Test | | My First 1000 Words | Pre School and Primary School |
|---|---|---|---|
| Spellings Practice | Spel. Special Cases | | |
| Singlish | **Oral Test** | | |
| Let's Write & Read Names | Step VI(oral) | | |
| Drawing and colouring pictures | Step V (oral) | | |
| | Step IV (oral) | | |
| | Step III (oral) | | |
| | Step II (oral) | | |
| | Step I (oral) | | |

| English ABCD | Test |
|---|---|
| | Alphabetical Order |
| | Copywriting |
| | Writing Single Letters |
| | Alphabet |



Total English Solution

සෑම දරුවෙකු ම හැදෑරිය යුතු ම ඉංග්‍රීසි පාඨමාලාව - "මූලික ඉංග්‍රීසි" වෙත සාදරයෙන් පිළිගනිමු.
"මූලික ඉංග්‍රීසි", "සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි 3 වන පාඨමාලාව යි.

**මෙම කට්ටලය තුළ පහත දෑ ඇතුළත් ය.**

1. උපදෙස් අත්පොත
   (හොඳ ම ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා පාඨමාලාව හදාරන අයුරු දැනගැනීම පිණිස පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ප්‍රවේශමෙන් කියවීම සඳහා)
2. ව්‍යාකරණ පොත්
   I. Singular - Plural
   II. Articles
   III. Possession
   IV. Basic sentences
   V. Let's Use Verbs in Sentences
   VI. Auxiliaries
   VII. Let's Use Adjectives and Adverbs
   VIII. Participles and Ordinals with nouns
3. වාග්මාලාව වර්ධනය සඳහා
   I. වචන මාලාව
   II. ප්‍රශ්න පත්‍රය
4. ලිඛිත පරීක්ෂණය සඳහා ප්‍රශ්න පත්‍රය
5. සහතිකය

මාපා ගුරුගෙදර www.MAPAlk.com

කිසිවක් අඩු නැති බව පරීක්ෂා කර තහවුරු කර ගන්න.

<u>**මෙම පාඨමාලාවේ අරමුණු**</u>

මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ “මගේ පළමු වචන 1000” පාඨමාලාව තුළ දී ඉගෙනගත් වචන භාවිතා කරමින් සරල වාක්‍ය ගොඩනැගීමට හුරුවීම යි.
එය පහත පරිදි උප අරමුණු හතරකට බෙදා දැක්වීමට ද හැක.

1. නාම පද භාවිතා කරමින් සරල වාක්‍ය ගොඩනැංවීම (පවත්නා තත්වයක් ප්‍රකාශ කිරීමට භාවිතා කෙරෙන ක්‍රියා පද දෙක පමණක් භාවිතා කිරීමට සිදුවනු ඇත.)
2. (කරන දෙයක් හෝ සිදුවන දෙයක් දක්වන) ක්‍රියා පද භාවිතා කරමින් සරල වාක්‍ය ගොඩනැංවීම

3. නාම විශේෂණ පද භාවිතා කරමින් සරල වාක්‍ය ගොඩනැංවීම
4. ගොඩනගන ලද සරල වාක්‍ය ක්‍රියා විශේෂණ පද, නිපාත පද සහ සුදුසු තවත් වචන ("මගේ පළමු වචන 1000" පාඨමාලාව තුළ ඉගෙන ගත් සහ නොගත් වචන සහ සංඥා නාම) භාවිතා කරමින් අලංකාර කිරීම

**<u>"සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි අනෙකුත් පාඨමාලා සමඟ මෙම පාඨමාලාවේ සම්බන්ධය</u>**

"මගේ පළමු වචන 1000" පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරු ව ශිෂ්‍යයාට "මූලික ඉංග්‍රීසි" නමැති මෙම පාඨමාලාව හැදෑරිය හැක.

"සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි දෙවන පාඨමාලාව වන "මගේ පළමු වචන 1000" පාඨමාලාවේ අන්තර්ගතය සහ තුන්වන පාඨමාලාව වන "මූලික ඉංග්‍රීසි" නමැති මෙම පාඨමාලාවේ අන්තර්ගතය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇත.

පවත්නා තත්වයක් ප්‍රකාශ කිරීමට භාවිතා කෙරෙන "සිටිනවා" සහ "තිබෙනවා" යන ක්‍රියා පද දෙක පමණක් භාවිතා කරමින් සහ නාම පද බහුල ව භාවිතා කරමින් වාක්‍ය ගොඩනැංවීම හතරවන ව්‍යාකරණ පොතෙහි අරමුණ යි. මේ සඳහා අවශ්‍ය වන නාම පද 650ක් ඉගෙන ගැනීමට ලැබෙනුයේ "මගේ පළමු වචන 1000"හි පළමු පියවර හතරෙහි දී ය. එම වාක්‍ය ගොඩනැඟීමේ දී බහු වචන නාම පද අනිවාර්යයෙන් ම භාවිතා කිරීමට සිදු වන නිසා යම් පමණකට ඒක වචන සහ බහු වචන පිළිබඳ අධ්‍යයනය කිරීම පළමු ව්‍යාකරණ පොතෙහි අරමුණ යි. ගොඩනඟන වාක්‍ය තුළ ඒක වචන නාම පද භාවිතා කිරීමට සිදුවන අවස්ථාවල දී එම ඒක වචන නාම පද සමඟ යෙදෙන "ක්" යන්න (උදා: පොත<u>ක්</u>) සහ ඒක වචන සහ බහු වචන යන දෙවර්ගය ම සමඟ යෙදෙන "ඒ" යන්න (උදා: <u>ඒ</u> පොත/පොත්) නිවැරදී ව ඉංග්‍රීසි බසින් දක්වන ආකාරය අධ්‍යයනය කිරීම දෙවන ව්‍යාකරණ පොතෙහි අරමුණ යි. ගොඩනඟන වාක්‍ය තුළ අයිතිය පිළිබඳ යම් අදහසක් ප්‍රකාශ කිරීමට සිදුවන්නේ නම් එය ප්‍රකාශ කරන ආකාරය අධ්‍යයනය කිරීම තුන්වන ව්‍යාකරණ පොතෙහි අරමුණ යි. ඒ අනුව හතරවන පොතෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට ආධාරක වන කාරණා පළමු, දෙවන සහ තෙවන පොත්වලින් ආවරණය කෙරේ.

"මගේ පළමු වචන 1000"හි පස්වන පියවරේ දී ශිෂ්‍යයාට ඉගෙන ගැනීමට ලැබුණු ක්‍රියා පද භාවිතා කරමින් විධාන සහ ඉල්ලීම් සිදුකරන අයුරු ද වර්තමාන සහ අතීත කාල වාක්‍ය ගොඩනගන අයුරු ද ඉගෙනීම පස්වන ව්‍යාකරණ පොතෙහි අරමුණ යි. මෙලෙස ගොඩනගන වාක්‍ය තව දුරටත් අලංකාර කරගැනීම සඳහා ප්‍රයෝජනවත් වන සුළු සුළු කාරණා කිහිපයක් ද මෙහි දී ඉගෙන ගත හැක. ක්‍රියා පදයට මුල් තැන දෙමින් ගොඩනැගූ මෙම වාක්‍ය අනාගත කාලය ද ඇතුළත් ව

තවත් විවිධ කාලවලින් ප්‍රකාශ කරන අයුරු ද එම ක්‍රියා පදය විවිධ ස්වරූපයන්ගෙන් ප්‍රකාශ කරන අයුරු (උදා: සැකයෙන්, තදින් වැනි) ද අධ්‍යයනය කිරීම හයවන පොතෙහි අරමුණ යි.

“මගේ පළමු වචන 1000”හි හයවන පියවරේ දී ඉගෙනගත් නාම විශේෂණ පද වෙනත් නාම පද සමඟ භාවිතා කරන අයුරු ද නාම පද සහ නාම විශේෂණ පද සුදුසු පරිදි ගලපමින් යම් පුද්ගලයකුගේ හෝ සත්වයකුගේ හෝ දෙයක ගුණයක් ප්‍රකාශ කිරීම සඳහා වාක්‍ය ගොඩනඟන අයුරු ද ඉගෙනීම හත් වන පොතෙහි අරමුණ යි. නාම විශේෂණ පද ඇසුරින් සාදාගත හැකි ක්‍රියා විශේෂණ පද පිළිබඳ ව ද හත් වන පොතෙහි දී අධ්‍යයනය කළ හැක. පස්වන සහ හයවන පොත් අධ්‍යයනය කරමින් ශිෂ්‍යයා ගොඩනැගීමට ඉගෙනගත් වාක්‍ය මෙවන් ක්‍රියා විශේෂණ පද භාවිතා කරමින් වඩාත් අර්ථවත් සහ අලංකාරවත් කරගත හැක.

“මගේ පළමු වචන 1000”හි පස්වන පියවරේ දී ඉගෙනගත් ක්‍රියා පදවලින් යම් කොටසක්, නාම විශේෂණ පද මෙන් නාම පද සමඟ භාවිතා කළ හැකි ආකාරය ද “මගේ පළමු වචන 1000”හි පළමු පියවර තුනේ දී ප්‍රමාණාත්මක අර්ථයක් සහිත ව උගත් සංඛ්‍යා නාමවලට අනුරූප ස්ථානීය අර්ථ සහිත වචන ද ඒවායේ භාවිතයන් ද අටවන පොත අධ්‍යයනය කිරීමෙන් ඉගෙනගත හැක.

ඒ අනුව මෙම පොත් අටෙහි එක එකක් අතර ද “මගේ පළමු වචන 1000”හි එක් එක් පියවරක් අතර ද තිරස් සහ සිරස් සම්බන්ධතාවයක් ඇති බව ඔබට පෙනෙනු ඇත. එනම් පළමුවෙන් ඇති පොත අධ්‍යයනය කර ලබාගන්නා දැනුම සහ (වාක්‍ය ගොඩනැගීමේ) හැකියාව ඊළඟට ඇති පොත අධ්‍යයනය කිරීමට අත්‍යවශ්‍ය ම වේ.

| “මගේ පළමු වචන 1000” | | "මූලික ඉංග්‍රීසි" |
|---|---|---|
| 1. පළමු පියවර - නාම පද 150<br>2. දෙවන පියවර - නාම පද 150<br>3. තුන්වන පියවර - නාම පද 175<br>4. හතරවන පියවර - නාම පද 175 | ➡ | 1. Singular - Plural<br>2. Articles<br>3. Possession<br>4. Basic sentences |
| 5. පස්වන පියවර - ක්‍රියා පද 300 | ➡ | 5. Let’s Use Verbs in Sentences<br>6. Auxiliaries |
| 6. හයවන පියවර - නාම විශේෂණ පද 50 | ➡ | 7. Let’s Use Adjectives and Adverbs<br>8. Participles and Ordinals with nouns |

www.MAPAIK.com

“මගේ පළමු වචන 1000” සහ "මූලික ඉංග්‍රීසි" යන මෙම පාඨමාලා දෙක අතර මෙවන් සම්බන්ධතාවයක් පවතින බැවින් “මගේ පළමු වචන 1000” පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් තොර ව "මූලික ඉංග්‍රීසි" යන මෙම පාඨමාලාව හැදෑරීම අසාර්ථක ව්‍යායාමයක් වනු ඇත.

එසේ ම "මූලික ඉංග්‍රීසි" නමැති මෙම පාඨමාලාවේ අන්තර්ගතය සහ "සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි අවසන් පාඨමාලාව වන “සා. පෙළට ඉංග්‍රීසි” පාඨමාලාවේ අන්තර්ගතය අතර ද අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇත. එනම් එම පාඨමාලාව තුළ දී හැදෑරීමට සිදුවන ව්‍යාකරණ ද ලිවීම ද පදනම් වනුයේ මෙම පාඨමාලාව තුළ දී හැදෑරීමට ලැබෙන මූලික ව්‍යාකරණ කාරණා සහ ලිවීම මත ය.

**<u>ශිෂ්‍යයා පෙළඹවීම</u>**

ශිෂ්‍යයා ප්‍රධාන පියවර අටකින් සහ ලිඛිත පරීක්ෂණයකින් යුතු මෙම "මූලික ඉංග්‍රීසි" පාඨමාලාවේ එක් එක් පියවරක් සම්පූර්ණ කළ විට ගුරුතුමාට එම ශිෂ්‍යයාගේ ප්‍රගති සටහනෙහි (2 පිටුව) අදාළ කොටුව වර්ණ ගැන්විය හැක.

ශිෂ්‍යයා පෙළඹවීම සඳහා ඔහුගේ ප්‍රගති සටහනෙහි අදාළ කොටු වර්ණ ගැන්වීමේ ක්‍රියාව "මූලික ඉංග්‍රීසි" පාඨමාලාව තුළ දී පමණක් නොව "සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි ඇතුළත් අනෙකුත් පාඨමාලා තුන තුළ දී ද ක්‍රියාත්මක කිරීමට මතක තබා ගත යුතු ය.

මාපා ගුරුගෙදර www.MAPAlk.com

<u>"මූලික ඉංග්‍රීසි" හැදෑරීම සඳහා උපදෙස් / පියවර</u>

## <u>1 වන පියවර - Singular - Plural</u>

Singular - Plural යනු ඒක වචන සහ බහු වචන යි.

එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එය සම්පූර්ණ කරන්න.

"මූලික ඉංග්‍රීසි" පාඨමාලාව තුළ දී ඒක වචන සහ බහු වචන පිළිබඳ ව මෙපමණක් දැන ගැනීම ප්‍රමාණවත් වන අතර එය ශිෂ්‍යයාට ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන අදහස්වලින් බොහෝ ප්‍රමාණයක් නිවැරදි ව ප්‍රකාශ කිරීමට උදව් වනු ඇත.

ඒක වචන සහ බහු වචන පිළිබඳ මෙම මට්ටම ඉක්මවා ගිය දැනුමක් "සා. පෙළට ඉංග්‍රීසි" පාඨමාලාව තුළ එන පාඩමක දී ශිෂ්‍යයාට ලබාගැනීමට හැක.

## <u>2 වන පියවර – Articles</u>

Articles යනු a , an සහ the යන පද තුන යි.

ඒක වචන නාම පද සමඟ යෙදෙන “ක්” යන්න (උදා: පොත<u>ක්</u>) සහ ඒක වචන සහ බහු වචන යන දෙවර්ගය ම සමඟ යෙදෙන “ඒ” යන්න (උදා: <u>ඒ</u> පොත/පොත්) ඉංග්‍රීසි බසින් දැක්වීම සඳහා භාවිතා කෙරෙන a , an , the පිළිබඳ මෙහි දී

අධ්‍යයනය කළ හැක. නිශ්චිත දෙයක් පිළිබඳ ව සඳහන් කිරීමේ දී භාවිතා කෙරෙන "ඒ" යන්න සිංහල බසින් සෑම විටක ම ප්‍රකාශ නොවේ.
"ක්" යන්න දැක්වීම සඳහා යොදා ගැනෙන a සහ an යන පද දෙකෙන් නිවැරදි පදය තෝරා ගැනීම සඳහා භාවිතා කළ යුතු නිවැරදි ක්‍රමවේදය මෙහි දී ඉගෙන ගත හැක. එම පද දෙකෙන් නිවැරදි පදය තෝරාගැනීම පිළිබඳ ව සමාජයෙහි මුල්බැස ගෙන ඇති ජනප්‍රිය ක්‍රමවේදයෙහි ඇති දෝෂසහගතබව ද ශිෂ්‍යයාට මෙහි දී හඳුනාගත හැකි වනු ඇත.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 3 වන පියවර - Possession

Possession යනු හිමිකම (අයිතිය) යි.
ශිෂ්‍යයා "මගේ පළමු වචන 1000"හි "නම් ලියමු කියවමු"හි දී ඉගෙන ගෙන ඇති පුද්ගල නාම (උදා: කුමාර) ද එම පාඨමාලාව තුළ සහ මෙම පාඨමාලාව තුළ මේ දක්වා ඉගෙන ගෙන ඇති වචන ද "ගේ" යන්න භාවිතා කරමින් සම්බන්ධ කිරීමට මෙහි දී ඉගෙන ගත හැක. අළුත් දෙයක් ලෙස මම, අපි වැනි සර්ව නාම පද හතක් ද ඒවාට අනුරූප මගේ, අපේ .... යන පද හත ද මෙහි දී ඉගෙන ගත හැක.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 4 වන පියවර - Basic sentences

Basic sentences යනු මූලික වාක්‍ය යි.
"මගේ පළමු වචන 1000" හි දී ඉගෙනගත් නාම පද ද "මූලික ඉංග්‍රීසි" හි ඉහත පියවර තුනේ දී ඉගෙනගත් කරුණු ද භාවිතා කරමින් කරන යමක් හෝ සිදුවන යමක් පිළිබඳ ප්‍රකාශ නොකර පවත්නා තත්වයක් පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට උපකාර වන සරල වාක්‍ය රටා කිහිපයක් මෙහි දී ඉගෙන ගත හැක.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 5 වන පියවර - Let's Use Verbs in Sentences

Let's Use Verbs in Sentences යනු වාක්‍ය තුළ ක්‍රියා පද භාවිතා කරමු යන්න යි.
"මගේ පළමු වචන 1000"හි දී ඉගෙනගත් ක්‍රියා පද භාවිතා කරමින් විධාන වාක්‍ය සහ වර්තමාන කාල සහ අතීත කාල වාක්‍ය ගොඩනගන අයුරු ප්‍රධාන වශයෙන් මෙහි දී ඉගෙන ගත හැක. ඊට අමතර ව ප්‍රධාන ක්‍රියා පදවලට සිදුකරන සුළු සුළු

මාපා ගුරුගෙදර www.MAPAlk.com

එකතුකිරීම් මඟින් ගොඩනගාගත හැකි අර්ථයන් කිහිපයක් ද සාකච්ඡා කෙරේ. කර්තෘ සහ ක්‍රියා පදය සහිත ව ගොඩනගා ගන්නා වාක්‍යය තව දුරටත් අලංකාර සහ අර්ථවත් කරගැනීම සඳහා මෙම අර්ථයන් ප්‍රයෝජනවත් වනු ඇත.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 6 වන පියවර - Auxiliaries

Auxiliaries යනු උපකාරක ක්‍රියා පද යි.
ප්‍රධාන ක්‍රියා පදයකට පෙර පැමිණෙමින් එම ක්‍රියා පද ප්‍රධාන ක්‍රියා පදයේ ස්වරූපය වෙනස් කරන අයුරු මෙහි දී ඉගෙන ගත හැක.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

*************************************************************

ඉංග්‍රීසි බසෙහි ඉතා ම වැදගත් ව්‍යාකරණ පාඩමක් වන කාල භේදය පාඩමේ දී ශිෂ්‍යයකුට ඉගෙනගැනීමට ඇති කර්තෘ කාරක වාක්‍ය රටා (12) දොළහෙන් (9) නවයක් ද කර්ම කාරක වාක්‍ය රටා (8) අටෙන් (3) තුනක් ද ඉහත හයවන පියවර අවසන් වන විට ශිෂ්‍යයා විසින් අධ්‍යයනය කෙරී ඇති බව සතුටින් ප්‍රකාශ කළ හැක.

*************************************************************

## 7 වන පියවර - Let’s Use Adjectives and Adverbs

Let’s Use Adjectives and Adverbs යනු නාම විශේෂණ පද සහ ක්‍රියා විශේෂණ පද භාවිතා කරමු යන්න යි.
නාම විශේෂණ පද නාම පද සමඟ භාවිතා කරමින් සරල වාක්‍ය ගොඩනගන අයුරු ප්‍රධාන වශයෙන් මෙහි දී ඉගෙන ගත හැක.
"මූලික ඉංග්‍රීසි" පාඨමාලාව තුළ දී එම හැකියාව පමණක් ප්‍රමාණවත් වන අතර මෙම මූලික මට්ටම ඉක්මවා සැසඳීම සඳහා නාම විශේෂණ පද භාවිතා කිරීම "සා. පෙළට ඉංග්‍රීසි" පාඨමාලාව තුළ එන පාඩමක දී ශිෂ්‍යයාට ඉගෙනීමට හැක.
එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 8 වන පියවර - Participles and Ordinals with nouns

Participles and Ordinals with nouns යනු නාම පද සමඟ කෘදන්ත සහ ස්ථානීය අර්ථ සහිත සංඛ්‍යා නාමයන් ය.

ශිෂ්‍යයා මේ වන විට ද දැන සිටින අතීත කාල සහ වර්තමාන කාල කෘදන්ත ක්‍රියා පද අර්ථයේ සුළු වෙනසක් සහිත ව නාම විශේෂණ පද මෙන් නාම පද සමඟ භාවිතා කරන අයුරු ද ස්ථානීය අර්ථ සහිත සංඛ්‍යා නාමයන් නාම විශේෂණ පද මෙන් නාම පද සමඟ භාවිතා කරන අයුරු ද මෙහි දී ප්‍රධාන වශයෙන් ඉගෙන ගත හැක.

එම පොතෙහි සඳහන් උපදෙස් අනුගමනය කරමින් එම සියල්ල අධ්‍යයනය කරන්න.

## 9 වන පියවර - වාග්මාලා පරීක්ෂණය

පාඨමාලාව අවසානයේ ලිඛිත පරීක්ෂණයට මුහුණ දීම සඳහා ශිෂ්‍යයා හොඳ වචන දැනුමකින් සන්නද්ධ වී සිටිය යුතු ය. ඒ සඳහා ශිෂ්‍යයා “මගේ පළමු වචන 1000” සහ "මූලික ඉංග්‍රීසි" යන පාඨමාලා දෙක තුළ දී ඉගෙනගත් වචන ඔහුට ප්‍රයෝජනවත් වනු ඇත. එලෙස ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන මේ දක්වා ඉගෙනීමට නොලැබුණු අළුත් වචන එකතුවක් ද මෙම ඉගෙනුම් ආධාරක කට්ටලයෙහි අන්තර්ගත වේ. ලිඛිත පරීක්ෂණයට මුහුණ දීමට පෙර එම වචන අධ්‍යයනය කර මතක තබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

පළමු ව එම වචන ලැයිස්තුව අධ්‍යයනය කරන්න. දෙවනු ව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා ශිෂ්‍යයාගේ මතකය පරීක්ෂා කර බැලිය හැක.

එම වචන පිළිබඳ හොඳ මතකයක් නොමැති ව ලිඛිත පරීක්ෂණයට මුහුණ දීම සුදුසු නොවේ.

## 10 වන පියවර - පෝෂණ අදියර

ශිෂ්‍යයාගේ භාෂා ඥාණය තව දුරටත් පෝෂණය කිරීම සඳහා පහත සඳහන් කාරණා මේ අදියරේ දී සාකච්ඡා කළ හැක. පැවරුමක් ද ශිෂයයාට ලබා දිය හැක.

<u>ඉහත හතරවන, පස්වන, හයවන සහ හත්වන පියවරවලට අදාළ ව</u>

<u>(Basic sentences, Let’s Use Verbs, Auxiliaries and Let’s Use Adjectives)</u>

- ✓ එම වාක්‍ය නැත යන අර්ථයෙන් ප්‍රකාශ කරන අයුරු
- ✓ එම වාක්‍ය අගට සිංහලෙන් ‘ද’ යෙදී ප්‍රශ්න සැදෙන ආකාරයට ප්‍රශ්න විමසන අයුරු
- ✓ කවුද? කාවද? කාටද? කාගේ ද? කුමක් ද? කෙසේ ද? කොහේ ද? කවදා ද? වැනි වෙනත් ප්‍රශ්න වචන භාවිතා කරමින් ප්‍රශ්න විමසන අයුරු

## 11 වන පියවර - ලිඛිත පරීක්ෂණය

ශිෂ්‍යයා "මූලික ඉංග්‍රීසි" නමැති මෙම පාඨමාලාව තුළ ඉගෙන ගත් විෂය කරුණු කෙතරම් හොඳින් ග්‍රහණය කරගත්තේ ද යන්න මැනබැලීම සඳහා මේ සමඟ

පැමිණෙන ලිඛිත පරීක්ෂණය ඔවුන්ට ලබා දිය හැක. එම පරීක්ෂණයේ දී 65%කට වඩා ලකුණු ලබා ගෙන තිබේ නම්, ඔහුට ඊළඟ පියවර වන ඉදිරිපත් කිරීම වෙත යා හැක.

එහෙත් මෙම ලිඛිත පරීක්ෂණය අවස්ථා කිහිපයක් උත්සාහ කර 75% - 85%ක ලකුණු ප්‍රමාණයක් සහිත ව ඊළඟ පියවර වෙත යාම වඩා සුදුසු ය. එයින් ඉදිරියේ දී ඇතිවන අපහසුතා අවම කරගත හැක.

**12 වන පියවර – ඉදිරිපත් කිරීම**

එම ලිඛිත පරීක්ෂණයෙන් අනතුරුව ශිෂ්‍යයා ලිඛිත පරීක්ෂණයේ දී ඒ ආකාරයට පිළිතුරු සැපයීමට බලපෑ ව්‍යාකරණ නීති පැහැදිලි කරමින් ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය. මේ මගින් සැකයෙන් යුතු ව පිළිතුරු සැපයීම, පිළිතුරු නොදැන පිළිතුරු සැපයීම වැනි ක්‍රම අනුගමනය කරමින් ලිඛිත පරීක්ෂණයේ දී ලකුණු ලබාගැනීම අධෛර්යමත් කිරීම අරමුණු කෙරේ. එසේ ම කියවීම, සවන්දීම සහ කථනය යන අනෙකුත් භාෂා කුසලතා ද පෞරුෂත්ව ගතිලක්ෂණ ද යම් පමණකට පරීක්ෂා කරගැනීමට මෙය හොඳ අවස්ථාවකි.

**13 වන පියවර – අවසානය**

ගුරුතුමා සෑහීමට පත්වන අයුරින් ශිෂ්‍යයා ඉහත ඉදිරිපත් කිරීම ද සිදුකර ඇත් නම් සහතිකය නිකුත් කරනු ලැබිය හැක. මෙම සහතිකය ශිෂ්‍යයා සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයෙන් වඩා හොඳින් සමත් වනු ඇති බව කල්වේලා ඇති ව ම ඔහුට පවසන සහතිකය යි.

**ඉවසීමෙන් සැනසීම ලැබේ.**

සාර්ථකත්වයට පත් වන තුරු ම ශිෂ්‍යයා පාඨමාලාව අත්නොහැරීම මම අපේක්ෂා කරමි. ඒ සඳහා පාඨමාලාව හදාරන ශිෂ්‍යයාට මෙන් ම ඔහුගේ දෙමව්පියන්ට ද / භාරකරුවන්ට ද හොඳ ඉවසීමක් තිබිය යුතු ය. එම ඉවසීම සඳහා හිමිවිය යුතු හොඳ ම ත්‍යාගය සාමාන්‍ය පෙළ ඉංග්‍රීසිවල දී ශිෂ්‍යයාට ස්ථිර ව ම හිමිවනු ඇත.

මම

කණිෂ්ක ජයතිලක ගුරුතුමා


***************************************************************

මෙම උපදෙස් මාලාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් කියවීම සඳහා :
http://www.MAPAlk.com/english/basicenglish/

www.MAPAlk.com

පාඨමාලා 4ක් - එක ම ඉලක්කයක්

# සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම



English for O/Level

Basic English

My First 1000 Words


English ABCD

# Total English Solution

## සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම

භාෂා ගුරුගෙදර
071 8 111 600
www.MAPAlk.com

Grade 1 - Grade 5 Grade 6 - Grade 11



වචන words → වාක්‍ය sentences → රචනා compositions →




## English ABCD

Let's start from alphabet

## MY FIRST 1000 WORDS

- ✓First step – 150 nouns
- ✓Second step – 150 nouns
- ✓Third step – 175 nouns
- ✓Fourth step – 175 nouns
- ✓Fifth step – 300 nouns
- ✓Sixth step – 50 nouns

එක පියෙන් පියවර - සෙමෙන් පියෙන් ඉහළට

**Success has no shortcuts.ජයග්‍රහණයට කෙටි මං නොමැත.**

## English for O/L

For best results

- ✓ Tenses
- ✓ Active voice
  Passive voice
- ✓ Direct speech
  Indirect speech
  And many more …

- ✓ Letter writing
- ✓ Comprehension
- ✓ Essay writing
  And many more …

- ✓ Question papers

## Basic English

**Basic grammar and writing**

- ✓ Singular – Plural
- ✓ A, an, the
- ✓ Possession
- ✓ Basic sentences
- ✓ Let's Use Verbs
- ✓ Auxiliaries
- ✓ Let's Use Adjectives
- ✓ More Adjectives